# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1689/18 - 2011 ජනවාරි 21 වැනි සිකුරාදා - 2011.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

එල්.ඩී.-බී.275/41 (ii)

## රජයේ නිවේදන

### ණය සහන දායක ආඥාපනත (81 වැනි අධිකාරය වූ)

(81 වැනි අධිකාරය වූ) ණය සහන දායක ආඥාපනතේ 63 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 6 සහ 10 වැනි වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රවුෆ් හකීම්,
අධිකරණ අමාත්‍ය.

2010 ක් වූ දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

නියෝග

කලින් කල සංශෝධිත 1942 ජුලි මස 31 වැනි දින අංක 8979 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද 1942 ණය සහන දායක නියෝග පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) එහි 3 වැනි නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝග ආදේශ කිරීමෙන් :–

"3. (1) මණ්ඩලයේ හෝ ශාඛා මණ්ඩලයක රැස්වීමකට පැමිණෙන මණ්ඩලයේ හෝ ශාඛා මණ්ඩලයක සෑම සාමාජිකයකුට ම එක් එක් රැස්වීම සම්බන්ධයෙන් රුපියල් දහසක ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ රැස්වීමකට පැමිණෙන මණ්ඩලයක සභාපතිවරයාට එක් එක් රැස්වීම් වාරය සම්බන්ධයෙන් රුපියල් එක දහස් පන්සියයක ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය.";

(2) එහි 4 වැනි නියෝගයේ –

(අ) එම නියෝගයේ (1) වැනි ඡේදයේ (ii) වැනි අනු ඡේදය වෙනුවට පහත දැක්වෙන අනු ඡේදය ආදේශ කිරීමෙන් :–

"(ii) රැස්වීමකට පැමිණීම සඳහා සාමාජිකයකු විසින් මෝටර් වාහනයක් භාවිත කරන අවස්ථාවක එක් රැස්වීමකට රුපියල් පන්සියය බැගින් ද, සභාපතිවරයා සම්බන්ධයෙන් වන විට එක් රැස්වීමකට රුපියල් හත්සිය පනහ බැගින් ද,";

(3) එම නියෝගයේ (2) වැනි සහ (3) වැනි ඡේද වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(2) (1) ඡේදය යටතේ ගෙවනු ලබන යම් මුදලකට අමතරව, සභාපතිවරයා සහ මණ්ඩලයේ හෝ ශාඛා මණ්ඩලයක සෑම සාමාජිකයෙක් ම තම නිවසින් බැහැරව නිල කාර්යයක යෙදී සිටින විට ඔහුට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි 12 වැනි වගන්තිය යටතේ රුපියල් පන්සියයක ඒකාබද්ධ දීමනාවක් ගෙවනු ලැබිය යුතු ය.".

(4) මෙහි කරන ලද සංශෝධන 2010 අගෝස්තු මාසයේ 1 වැනි දින බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

02-58


1A - G 14011— 830 (2011/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.